# Dalai Lama shares a joke with 'good human' Prince Charles

# දලයි ලාමා සහ සුමිතුරු චාර්ල්ස් කුමරු

**දලයි ලාමා තුමාගේ බ්‍රිතාන්‍ය චාරිකාව**


## Duke's Court Travel

DUKE'S COURT TRAVEL

### Fly to Colombo

| Airline | Fare |
| --- | --- |
| SriLankan Airlines | fr £320 + Taxes |
| Qatar Airways | fr £245 + Taxes |
| Kuwait Airways | fr £220 + Taxes |
| Emirates | fr £380 + Taxes |
| Etihad Airways | fr £195 + Taxes |
| Oman Air | fr £205 + Taxes |
| Jet Airways | fr £199 + Taxes |

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

**020 8748 3535**

3045 ATOL PROTECTED · AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS · IATA

**204 King Street, London W6 0RA**




The Dalai Lama and Prince Charles looked every bit the best of friends as they enjoyed a laugh together during a meeting at Clarence House, which is London's official residence of the Royal.

The Royal couple took the Dalai Lama to see the magnolia spectrum tree he planted in the royal residence's garden following their last meeting in 2008.

After a brief tour of some of the flower beds the spiritual figurehead, who had grasped Charles' right hand, stopped in front of the waiting media and said about the Prince: " I always consider him from my first meeting, a very close, best of friends."

The Dalai Lama also called on people of all faiths to work for the good of humanity and care for the environment.

In an address at Westminster Abbey, he said religious faith should not be confined to buildings or books and should be used to help people. " I think millions of people have a genuine sense of spirituality; we must work together to serve humanity," he added.

"We now also have responsibility for the care of the planet. I am quite sure that religions still have an important role to make a better humanity."

ටිබෙට් හි අධ්‍යාත්මික නායක පූජ්‍ය දලයි ලාමා තුමෝ පසුගිය මස දින 10 ක සංචාරයක් සඳහා බ්‍රිතාන්‍යයට පැමිණියහ. මෙහිදී එතුමන් ඉහළින් පිළිගන්නා ලද අතර චාර්ල්ස් කුමරු හා ඔහුගේ ආර්යාව කැමිලා විසින් දලයි ලාමා වෙනුවෙන් ක්ලැරන්ස් හවුස් නම් රාජකීයයන්ගේ ලන්ඩන් නිල නිවහනේදී විශේෂ පිළිගැනීමක් සූදානම් කරනු ලැබ තිබුණි. එකිනෙකාගේ අත් අල්ලා ගෙන විහිලු තහලු කරමින් සිනහ වෙමින් චාර්ල්ස් කුමරු හා දලයි ලාමා. පිළිසඳරේ යෙදුනහ. හැම අතින්ම ඔවුන් අතිශය සුහද මිතුරන් බව පැහැදිලිව පෙනිණ.

2008 වසරේ එම මන්දිර භූමියට පැමිණි වෙලේ දලයි ලාමා තුමා එම වත්තේ පැළකර ගිය මැග්නෝලියා පැළය දැන් පඳුරක්ව වැඩී ඇති සැටි දකින්නට ද ගියේ ය.

පැයක් පමණ කාලයක් ක්ලැරන්ස් හවුස්හි ගත කළ දලයි ලාමා එම මන්දිරය අසළ රැස්ව සිටි පත්‍රකලාවේදීන් සහ වාර්තාකරුවන් හා සුහදව කතාකරමින් එතැන්හි දී ද චාර්ල්ස් කුමරා පිළිබඳ වර්ණනාත්මක වචන තෙපලීය. " මා ඔහු හමුවුණු මුල්ම දිනයේදී ඔහු ඉතා යහපත් මනුෂ්‍යයෙක් හා මිතුරෙක් ලෙස හඳුනාගත්තා. ඔහු පිළිබඳව ඒ අදහස මතය මගේ හැම විටම තිබෙනවා". දලයි ලාමා කීවේය. එයට පිළිතුරු දුන් චාර්ල්ස් කුමරුද වාර්තාකරුවන්ට කීවේ තමාද දලයි ලාමා තුමා ඉහළ පෙලේ මිතුරෙකු ලෙස හැමවිටම පිළිගන්නා බවයි.

පසුදින ලන්ඩනයේ වෙස්මිනිස්ටර් ඇබේ දේවස්ථානයේ සියළුම ආගම්වලට නිකායන්ට අයත් නායකයින් හා රජයේ හා විපක්ෂයේද මැති ඇමතිවරුන් ඇතුළු ප්‍රභූවරුන් ඇමතීමේ සභාවක් දළයි ලාමාතුමා වෙනුවෙන් පිළියෙල කර තිබිණ. එහිදී එහි පිරිස අමතමින් දලයි ලාමා කියා සිටියේ ආගමික මතිමතාන්තර අදහස් හා විශ්වාස ගොඩනැගිලිවලට හා පොත්පත්වලට පමණක් සීමා නොකර ඒවා මිනිස් යහපතට හා දියුණුවට යෙදවිය යුතු බවයි.

" අධ්‍යාත්මික පැත්තට නැඹුරුවුණු ඉතා මානුෂිකව සංවේදීව සිතන පතන මිලියන ගණනක් අද දවසෙ ලෝකෙ ඉන්නවා. අපි අන්න ඒ මනුෂ්‍යත්වයට ආමන්ත්‍රණය කළ යුතුයි. ඒ මනුෂ්‍යත්වය නගා සිටුවිය යුතුයි."

දළයි ලාමා තුමෝ වැඩිදුරටත් කීහ.

" ඒ වගේම මම මතක්කර දෙන්න කැමතියි, දැන් අපට තවත් විශාල වගකීමක් තියනවා, මේ අප ජීවත්වන ලෝකය ආරක්‍ෂා කරගන්න. එසේම මම විශ්වාස කරනවා යහපත් මනුෂ්‍ය සමාජයක් සඳහා වැදගත් කාර්යයක් සියළු ආගම් ධර්මයන්ට ඉටුකළ හැකි බව."

දලයි ලාමාතුමාගේ දේශනය ඇසීමට වෙස්ට්මිනිස්ටර් ඇබේ දේවස්ථානයට රැස්ව සිටි විවිධ ආගමික කොටස් අතර ක්‍රිස්තියානි, කතෝලික, යුදෙව්, හින්දු, සීක් ආදී ආගම්වලට අයත් පූජකවරු රාශියක් වූහ. එතුමන්ගේ දේශනය අගය කරමින් මෙහි විවිධ පුවත් පත් හා මාධ්‍යයන්හි වාර්තා පළවුණි.

පසුදා දලයි ලාමා බ්‍රිතාන්‍යයේ ලේබර් පක්‍ෂයේ නායක එඩ් මිලිබෑන්ඩ් සහ ආරක්‍ෂක ලේකම් ඩග්ලස් ඇලැක් සැන්ඩර් යන දෙදෙන ද හමුවීය.

## දලයි ලාමා චාරිකාවට චීනයේ නොමනාපය

චීනය සහ දලයිලාමා අතර ඇයි හොඳයි කමක් නැති බව මුලු ලොවම දන්නා කාරණයකි. චීනය සලකන්නේ දලයිලාමා චීන රාජ්‍යයේ සතුරෙකු හැටියටය. කෑල්ලක් වෙන්කර ගන්නට හදන බෙදුම්වාදියෙකු ලෙසය. ටිබෙට් ජනතාව එසේ සිතන්නේ නැත. ඔවුනට දලයි ලාමා යනු ජීවමාන දෙවි කෙනෙකි. විමුක්තිදායයාණන් කෙනෙකි. මේ තත්වය යටතේ දලයි ලාමා කිසියම් රටකට ආරාධනා කරනවාට චීනය කැමති නැත. දලයි ලාමා ගෙන්වූ නිසා දැනට චීනය අග මැති ඩේවිඩ් කැමරන් සමගද උරණ වී සිටී.

දලයි ලමා බ්‍රිතාන්‍යට පැමිණ මුලින්ම ගියේ යෝක්ෂයර් හි ජාත්‍යන්තර වෙළඳ සමුළුවකටය. ඊට යාබද ලීඩ්ස් නගරයේ ක්‍රීඩා සංකීර්ණයක් කුලියට ගෙන චීනයේ සිට පැමිණි ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 200 ක් ළඟ එන ඔලිම්පික් සඳහා මේ දිනවල පුහුණු වෙති. ඒ සංකීර්ණයේ කුලිය සඳහා චීනය පවුම් දෙලක්‍ෂ පණස්දහසක් ගෙවා ඇත. එසේ තිබියදීත් ඒ යාබද නගරයට දලයි ලාමා ගෙන්වීම බ්‍රිතාන්‍යය තමන්ට කනට ගැහුවා හා සමානයයි චීනය කියා ඇත.

♦ **සුධර්මන් ගුණසේකර** London


No 1 to SRI LANKA

## ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්‍ෂණිකව සහ සුරක්‍ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.

- දිවයින පුරා විහිදුනු කොමර්ෂල් බැංකු ශාඛා ජාලය සමග එක්ව, එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
- ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්‍ෂණිකව බැර කිරීම
- ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
- රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
- ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්‍ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

FAST CASH
SEND TODAY - COLLECT TODAY

Transfer Fees From only £5



COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK LIMITED · NSB · HSBC · PEOPLE'S BANK · සම්පත් බැංකුව SampathBank · NDB bank · Standard Chartered

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි

ක්‍ෂණික ඇමතුම්: 020 8886 4488

www.efastcash.co.uk